# දුම්රිය බලපත්

යුද හමුදාවේ පුද්ගලයින්ට නිවාඩු දුම්රිය බලපත්‍ර ලබාදීම පාලනය වන්නේ 1957 යුද හමුදා නිවාඩු හා නිවාඩු දුම්රිය බලපත්‍ර රෙගුලාසි මගිනි. මෙම රෙගුලාසි විටින් විට සංශෝධනය විය හැකි අතර, සෑම අවස්ථාවකදීම ඒවා සේවයේ ඇති හදිසි අවශ්‍යතාවයන්ට යටත් වන්නේය. ඒ අනුව යුහ සාමාජිකයින් හට ලබාගත හැකි දුම්රිය බලපත්‍ර පහත සඳහන් පරිදි වේ.

**<u>දුම්රිය බලපත්‍ර වර්ග</u>**

අ. නිවාඩු දුම්රිය බලපත්‍ර

ආ. මාසික නිවාඩු දුම්රිය බලපත්‍ර

ඇ. රාජකාරි දුම්රිය බලපත්‍ර

**<u>නිවාඩු දුම්රිය බලපත්:</u>**

නිලධාරින් හා හෙ සෙසුනිලයින් හට එක් මුදල් වර්ෂයක් තුලදී ශ්‍රී ලංකා දුම්රිය සේවයේ ඕනෑම දුම්රිය ස්ථාන 02 ක් අතර යෑම් ඊම් සඳහා දුම්රිය බලපත්‍ර සඟල් 03කට හෝ තනි ගමන් සඳහා නිවාඩු දුම්රිය බලපත්‍ර 06කට හිමිකම ඇත.

**<u>මාසික නිවාඩු දුම්රිය බලපත්‍ර</u>**

ස්ථීර හෝ තාවකාලික සේවා ස්ථානය තුළ තුලවාසි වීමට නියෝග ලැබූ සියළුම විවාහක හෝ අවිවාහක නි/සෙසුනිලයින්ට තම සේවා ස්ථානයට ආසන්නම දුම්රිය ස්ථානයේ සිට ස්ථිර පදිංචි ලිපිනයට ආසන්නම දුම්රිය ස්ථානය දක්වා දුම්රියෙන් ගමන් ගැනීම සඳහා මාසිකව සඟලක් බැගින් දෙනු ලබන දුම්රිය බලපත්‍ර මාසික නිවාඩු දුම්රිය බලපත්‍ර වේ.

**<u>රාජකාරි දුම්රිය බලපත්‍ර</u>**

රාජකාරි කටයුත්තක් සඳහා තම සේවා ස්ථානයේ සිට, වෙනත් සේවා ස්ථානයකට ගමන් ගැනීම සඳහා දෙනු ලබන දුම්රිය බලපත්‍ර රාජකාරි දුම්රිය බලපත්‍ර වේ. මෙම දුම්රිය බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ සේවා ස්ථානයට ආසන්න දුම්රිය ස්ථානයේ සිට ගමන් ගන්නා ස්ථානයේ ආසන්නම දුම්රිය ස්ථානය වේ.

**<u>දුම්රියෙන් ගමන් ගැනීමට හිමි පංති:</u>**

සක්‍රිය සේවයේ යෙදී සිටින සෑම නිලධාරියෙකුට හා සෙසුනිලයෙකුට තමා වෙනුවෙන්ද තමන්ගේ කාලත්‍රයා සහ යැපෙන්නන් වෙනුවෙන්ද පහතින් දක්වා ඇති පරිදි දුම්රිය බලපත්‍ර වලට හිමිකම් ලැබේ.

| නිළය | පංතිය |
|---|---|
| නි/කෙනි/බලලත් නිළධාරි | 1 වන පංතිය |
| මා/සැ සිට කෝප්‍රල් නිළය දක්වා | 2 වන පංතිය |
| ලාකෝ සිට සාසෙ නිළය දක්වා | 3 වන පංතිය |

එසේ වුවත් 1979.02.28 වන දිනට පෙර යුද හමුදාවට බැඳුණු අයවලුන් ඇත්නම් ඔවුන් හට තමන්ට හිමි පුද්ගලික වරප්‍රසාදය ලෙස හිමි පංතියට වඩා ඉහල පංතියක බලපත්‍රයක් ලබාගැනීමට හිමිකම් ඇත.

**<u>පවුල පිළිබඳ විස්තර:</u>**

නි/සෙසුනිළයෙකුගේ පවුලේ පහත සඳහන් සාමාජිකයින්ට මෙම නිවාඩු දුම්රිය බලපත් ලැබීමට අයිතිවාසිකමක් ඇත.

අ. බිරිඳ, අවුරුදු 18 ට අඩු පිරිමි දරුවන් හා අවිවාහක ගැහැණු දරුවන්

ආ. නි/සෙසුනිළයෙකු විවාහ වීමෙන් පසුව ඔවුන් හට දරුවන් නොමැතිව දරුවන් වශයෙන් නීත්‍යානුකූලව හදාගන්නා අවු 18 ට අඩු පිරිමි දරුවන් හා අවිවාහක ගැහැණු දරුවන් (දරුවන් වශයෙන් නීත්‍යානුකූලව හදාගන්නා බවට අනි විසින් සෑහීමකට පත්විය යුතුයි)

ඇ. නි/සෙසුනිළයෙකුගේ යැපෙන මව සහ සොහොයුරියන්

නි/සෙසුනිළයෙකු විවාහ වූ මුදල් වර්ෂය තුළ ඔහුගේ බිරිඳ වෙනුවෙන් එම මුදල් වර්ෂයේ ඉදිරි කාලසීමාවට එක් දුම්රිය බලපත්‍රයක් නිකුත් කල හැක. නමුත් මෙසේ නිකුත් කරන දුම්රිය බලපත්‍ර එම වර්ෂය තුළ එම නි/සෙසුනිළයාගේ මව සහ සොහොයුරියන් වෙනුවෙන් නිතුත් කොට ඇති දුම්රිය බලපත්‍ර ප්‍රමාණය සමග සගල් 03 ක් නොඉක්ම විය යුතුය.

අවුරුදු 03 කට අඩු ළමයින් සඳහා දුම්රිය බලපත්‍ර නිකුත් නොකරන අතර, වයස අවුරුදු 03 සිට 12 දක්වා වන ළමයින් හට භාග අවසරපත්‍ර නිකුත් කල යුතුයි.

නිළධාරියාට හෝ සෙසුනිළයාට ගමන් කිරීමට අයිතිවාසිකම් ඇති පංතියේම ඔහුගේ පවුලේ අයට ගමන් කිරීමට අයිතිවාසිකමක් ඇත.

**<u>යැපෙන්නන් පිළිබඳ විස්තරඃ</u>**

නි/සෙසුනිළයා විසින් තම මව සහ සොහොයුරිය නිත්‍ය වශයෙන්ම තමාගෙන් යැපෙන බවට තහවුරු කල යුතුයි. අදාල අයවලුන්ගේ නඩත්තු කිරීම් වැඩිදුර වගකීම තමන් සතු බවට ඉල්ලුම්කරු විසින් සතුටුදායක ලෙස සනාථ කිරීමෙන් පසු මේ සම්බන්ධ අවසාන තීරණය අනි විසින් ගත යුතුයි.

මසකට රුඃ300.00 කට හෝ ඊට වැඩි ආදායමක් පියාට හා මවට ලැබේ නම් හෝ සොහොයුරිය වැටුප් ලබන රැකියාවක නිරත වන්නේ නම් මෙම සහනය නොලැබේ.

**<u>මුදල් වර්ෂයකට අඩු කාලසීමාවඃ</u>**

නි/සෙසුනිළයා අධිකාරියට පත්කරන ලද/යුධ හමුදාවට බඳවා ගත් මුදල් වර්ෂය තුළ එම අයට සහ ඔහුගේ පවුල වෙත නිකුත් කල හැකි දුම්රිය බලපත්‍ර ප්‍රමාණය එම වර්ෂයේ ඉතිරිව ඇති මාස ගණනට අනුව විය යුතුය.

**<u>නිදන මැදිරිඃ</u>**

නි/සෙසුනිළයන්ට ඔවුන්ගේ පවුල් සඳහා ඔවුන්ට ගමන් කිරීමට හිමිකම් ඇති පංතිවලට අනුව නිදන මැදිරි/ආසන ලබාගැනීමට අයිතිවාසිකම් ඇත. නිදන මැදිරි ඇතොත් පමණක් නිදන මැදිරි වෙන්කර දීමට කටයුතු කරන අතර, ඒ සඳහා අදාල නි/සෙසුනිළයා දුම්රිය නිළධාරින් සමග සම්බන්ධතාවයෙන් යුතුව කටයුතු කල යුතුය.

**<u>වාර්තාගත කිරීමඃ</u>**

පොදු 21 ආකෘතිපත්‍රය මගින් දුම්රිය බලපත්‍ර ලබාගැනීමට ඉල්ලුම් කල යුතුයි. එම බලපත්‍ර නිකුත් කිරීම සඳහා බතරොයි/බළසණ/කණ්ඩායම්වල නිළධාරි අණදෙන්නන් විසින් අනුමත කරන ලද නිවාඩු ප්‍රමාණය නිවාඩු වර්ගය හා නිවාඩු ආරම්භක, අවසන් වන දිනය සඳහන් කල යුතුය.

නිවාඩු දුම්රිය බලපත්‍ර නිකුත් කල යුත්තේ සේවා ස්ථානයෙන් බැහැරව යාම සඳහා නිවාඩු අනුමත කරන ලද නි/සෙසුනිළයෙකු හට වේ.

නිවාඩු දුම්රිය බලපත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම එම බලපත්‍රය අයදුම් කරන්නා විසින් අදාල සෑම විස්තරයක්ම ඇතුලත් කොට ආකෘතිපත්‍ර නිවැරදිව සම්පූර්ණ කර ඇති බවට බලපත්‍රය නිකුත් කරන නිළධාරියා විසින් පරීක්ෂා කර ස්ථිර කරගත යුතුය. තවද නිවාඩු දුම්රිය බලපත්‍ර ලේඛණයේ සටහන් කර එහි තම කෙටි අත්සන තැබිය යුතුය.

බලපත්‍රයක් නිකුත් කල දිනයට අනුව අදාල මුදල් වර්ෂයට බලපානු ඇත. සෑම බලපත්‍රයක් නිකුත් කිරීමට ප්‍රථම අනු අංක යෙදිය යුතුය. එක් එක් බතරොයි/බලසණ/අනුඛණ්ඩ වෙනුවෙන් බලපත්‍ර නිකුත් කිරීම සඳහා බලයලත් නිළධාරි විසින් ඒකක මූලස්ථානයේ පොදු 164 මත නිවාඩු දුම්රිය බලපත්‍ර ලේඛණය පිළියෙල කල යුතුයි.

මෙම බතරොයි/බලසණ/අනුඛණ්ඩ වෙතින් නිකුත් කරන ලද නිවාඩු බලපත්‍රවල පෙන්නුම් කරන ලද මිළ ගනන් ඇතුලත් වාර්ථාවක් ඊලග මාසයේ 05 වන දිනට ප්‍රථම ඒකක මූලස්ථානය වෙත ඉදිරිපත් කල යුතුයි. සෑම මසකම 10 වන දිනට ප්‍රථම මෙය පිළිබඳව ඒකාබද්ධ වාර්ථාවක් ඒකක මූලස්ථානය වෙතින් වැහාලේඅම වෙත ඉදිරිපත් කල යුතුයි.

<u>**දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම**</u>

අ. සෑම දුම්රිය බලපත්‍රයක්ම විධායක අධිකාරි හෝ සහායක විධායක අධිකාරි විසින් නිකුත් කල යුතුයි. ඒකක අනි හෝ ඔහු වෙනුවට විධායක අධිකාරි විසින් ලිපියක් මගින් බලය පවරන අවස්ථාවකදී අනුඛණ්ඩ නිළදාරි අණදෙන හට දුම්රිය බලපත් නිකුත් කල හැක.

ආ. එවැනි අනුමැතියක් නොලද අණුඛණ්ඩයකට හදිසි අවස්ථාවකදී දුම්රිය බලපත්‍රයක් ඒකක මූලස්ථානය වෙතින් ලබාගැනීමට කාලවේලාව නොමැති වූ විට එම අණුඛණ්ඩයට ආසන්නයේ පිහිටා ඇති ඒකකයකින් දුම්රිය බලපත්‍ර ලබාගැනීමට ඒකක මූලස්ථානයෙන් අනුමැතිය ලබාදිය හැක. අවශ්‍ය නම් මෙවැනි අනුමැතියක් ෆැක්ස් හෝ දුරකථන මගින් ලබාදී පසුව එය ලිපියක් මගින් සනාථ කල යුතුයි.

ඇ. සෑම තනි ගමනක් සඳහාම එක් බලපත්‍රයක් නිකුත් කල යුතුයි. නිකුත් කරන දිනය හා ගමන් කරන දිනයද බලපත්‍රයේ සඳහන් විය යුතුයි. මෙම දින දෙක අතර දින 14 කට නොවැඩි විය යුතුයි.

ඈ. දුම්රිය බලපත්‍ර ලේඛණ පොත් හා ඉල්ලුම්පත් පිරිසිදුවත්, නිවැරදිවත් පිළියෙල කොට නඩත්තු කල යුතුයි. සෑම දුම්රිය බලපත්‍රයකම උප පත්‍රිකාව පිළියෙල කරන ඒකකයේ තබාගත යුතුයි.

ඉ. තමන්ගේ ඒකක/අංශවල පුද්ගයින්ට දුම්රිය බලපත්‍ර නිකුත් කිරීමට බලයලත් නිළධාරි විසින් පහත සඳහන් විස්තර නිවැරදිව සම්පූර්ණ කර ඇත්දැයි පරීක්ෂා කල යුතුයි.

(1) බලපත්‍රයේ අදාල පේලියේ නිකුත් කරන ඒකකයේ නම

(2) රාජකාරි ස්වභාවය සඳහන් කිරීමේදී සම්පූර්ණ රාජකාරි ස්වභාවය සඳහන් කල යුතුයි. (නිවාඩු, කඳවුරකට සහභාගි වීම, සාකච්ඡාවකට සහභාගි වීම)

(3) නිවැරදිව වැය ශීර්ෂය හා උපශීර්ෂය අදාල ස්ථානයන් හි සඳහන් කල යුතුය. මෙය අවශ්‍ය වන්නේ බලපත්‍රය යුහමු ට ලැබුණු විට හරියාකාරව මුදල් හර කිරීමේ පහසුව සඳහාය.

(4) දුම්රිය බලපත්‍රයේ නම් වෙනස් කිරීමක් සිදුකලහොත් එවැනි ස්ථානවල බලපත්‍ර නිකුත් කරන නිළධාරියා විසින් අත්සන යොදා නිළ මුද්‍රාව තැබිය යුතුය.

**<u>දුම්රිය බලපත්‍ර භාරකාරත්වය:</u>**

අ. දුම්රිය බලපත්‍ර පොත් සෑම අවස්ථාවකදීම ඒකකයේ/අංශයේ මානි ගේ භාරකාරත්වය යටතේ ඉබි යතුරු දමා තබා ගත යුතුය.

ආ. වංචාවක් හෝ නැතිවීමක් සිදුවී නොමැති බව ස්ථිර කර ගැනීමට සියලුම දුම්රිය බලපත්‍ර පොත් භාරකාරත්වය දරණ නිළධාරි විසින් මාසිකව පරීක්ෂා කර බැලිය යුතුය.

ඇ. දුම්රිය බලපත්‍ර පොත් බලපත්‍ර නිකුත් කිරීම සඳහා භාරදුන් අවස්ථාවේ අනුමත කරන ලද බලපත්‍ර පමණක් නිකුත් කර ඇති බවට සහතික කර ගැනීම සඳහා එම පොත් ආපසු භාරගන්නා විට භාරකාරත්වය දරණ නිළධාරි විසින් පරීක්ෂා කල යුතුය. ප්‍රයෝජනයට නොගන්නා දුම්රිය බලපත්‍ර මුදල් වටිනාකමකින් යුත් ලියකියවිලි ලෙස සැලකිය යුතු අතර, මුරෙ 285 තරයේ පිළිපැදිය යුතුය.

**<u>රාජකාරි නැවැත්වීම:</u>**

නි/සෙසුනිළයෙකු රාජකාරි වලින් ඉවත් කර ඇති කාලසීමාවන් තුළ (රාජකාරි තහනම් කර ඇති විට) හෝ ඒ කාලසීමාව වෙනුවෙන් ඔහුට හෝ ඔහුගේ පවුලේ අයට නිවාඩු දුම්රිය බලපත්‍ර අනුමත නොකල යුතුය. මෙය බලපානු ලබන්නේ ඔහු නැවත සේවයේ පිහිටවන තුරුය.

**<u>වැරදි ලෙස පාවිච්චි කිරීම</u>**

අ. දුම්රිය බලපත්‍ර වෙනුවෙන් නිකුත් කරනු ලබන දුම්රිය ප්‍රවේශපත්‍ර පාවිච්චි කල හැක්කේ බලපත්‍රයේ නම් සඳහන් අයට පමණක් වන අතර, ඒවා අන්සතු කල නොහැක.

ආ. අන්සතු කිරීමක් හෝ කල්ඉක්මවා පාවිච්චි කිරීමෙන් හෝ එය බල නොපාන ප්‍රදේශයක ගමන් කිරීමට පාවිච්චි කිරීමෙන් හෝ බලපත්‍රයක් වැරදි ලෙස පාවිච්චි කරන්නා 1947 අංක 17 දරණ යුහ පනත යටතේ දඬුවම් ලැබීමට යටත් වන්නේය.

**<u>හිමි පංතියට වඩා උසස් පංතියක ගමන් කිරීම</u>**

යම් අයෙකුට තමන්ට හිමි පංතියට වඩා උසස් පංතියක ගමන් කිරීමට අවශ්‍ය වන්නේ නම් ප්‍රවේශපත්‍ර ලබාගන්නා එම ස්ථානයේදීම ගමන් ගාස්තුවල වෙනස ගෙවා එසේ කල හැක.

**<u>රෝගී පුද්ගලයින් දුම්රියෙන් ගමන් කරන පංතිය</u>**

රාජකාරි සඳහා දිවයිනේ ඕනෑම ස්ථානයකට යාකර සිටින පුද්ගලයින් රෝගී වූ අවස්ථාවලදී ඔහුගේ ඒකකය මගින් හෝ ආසන්නම රජයේ රෝහලකින් ප්‍රතිකාර ලබාගැනීමට නොහැකි වූ අවස්ථාවකදී හෝ කොළඹදී විශේෂ ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍ය විටකදී ඔහුට කොළඹට ගමන් ගැනීම සඳහා නිදන මැදිරි සහිත දුම්රියෙන් ගමන් ගැනීමට අයිතිවාසිකම් ඇති පංතියට වඩා ඉහල පංතියක ගමන් කිරීමට ඉඩ දිය හැක. එනම් 111 වන පංතියේ ගමන් කිරීමට හිමිකම් ඇති අයෙකුට 11 වන පංතියේ ගමන් ගැනීමටත්, 11 වන පංතියේ ගමන් ගැනීමට හිමිකම් ඇති අයෙකුට 1 වන පංතියේ ගමන් ගැනීමටත් ඉඩදිය හැක. රෝගී වූ පුද්ගලයා ගමන් ගන්නා පංතියේම ඔහු සමග ගමන් ගන්නා සේවකයින්ටද ගමන් ගැනීමේ හැකියාව ඇත. මේ සෑම අවස්ථාවකදීම රෝගී පුද්ගලයාට ඔහුට හිමි පංතියේ ගමන් ගැනීමට සුදුසු තත්වයක් නොමැති බවත්, සේවක මණ්ඩලයේ සාමාජිකයෙකු රෝගීයා සමග ගමන් කිරීමට අවශ්‍ය බවත්, වෛද්‍ය නිළධාරියෙකු සහතික කල යුතුය. ආපසු යාමේදී පහත පංතියක ගමන් කිරීම සුදුසු යැයි වෛද්‍යවරයෙකු නිර්දේශ කර ඇතොත් පමණක් එසේ කල හැක.

**<u>හමුදා පුද්ගලයින්ගේ ලගම නෑයාට දෙනු ලබන දුම්රිය බලපත්‍රය</u>**

පහත සඳහන් අවස්ථාවලදී ගමන් දෙකකට සීමාවන පරිදි හමුදා පුද්ගලයාගේ ලගම නෑයාට දුම්රිය බලපත්‍ර නිකුත් කල හැක.

අ. නි/සෙසුනිළයෙකු අසාධ්‍ය ලෙස රෝගාතුරව සිටින අවස්ථාවකදී ඔහුගේ ලගම නෑයාගේ පැමිණීම අවශ්‍ය බවට වෛද්‍ය නිළධාරියෙකු නිර්දේශ කරන අවස්ථාවක.

ආ. නි/සෙසුනිළයාගේ මරණය සිදුවූ අවස්ථාවේදී

මෙවැනි අවස්ථාවකදී පහත සඳහන් විස්තර ඒකකය විසින් හෝ යුධ හමුදා වෛද්‍ය සේවා අධ්‍යක්‍ෂක විසින් යුහමු වෙත දැන්විය යුතුය.

අ. නි/ රෙජි අංකය ...... නිළය ...... නම ......

ආ. ලගම නෑයාගේ නම සහ ලිපිනය

ඇ. ලගම නෑයාගේ පදිංචියට අදාල පොලිස් ස්ථානය (

(මෙවැනි අවස්ථාවක දුම්රිය බලපත්‍ර නිකුත් කිරීමට යුහමු වෙතින් ලගම නෑයාගේ පදිංචියට අදාල පොලිස් ස්ථානයට උපදෙස් ලබාදිය යුතුය. නි/සෙසුනිළයා ගමන් ගන්නා පංතියේම ලගම නෑයාට ගමන් කිරීමට දුම්රිය බලපත්‍ර නිකුත් කරන ලෙස උපදෙස් ලබාදිය යුතුවේ.)

**<u>පළවන පත්වීම ලැබූ අවස්ථාවඃ</u>**

විවාහ වූ නි/සෙසුනිළයෙකු යුධ හමුදාවේ ඔහුගේ පළමු පත්වීම ලබාගැනීමට යන විට රජයේ නිළධාරින්ට සකසා ඇති ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගමන් වියදම් ලැබිය යුතුය. නිළධාරි නිවස්නයේ හෝ බැරැක්කයේ ඉඩ නොමැති අවස්ථාවක නි/සෙසුනිළයා රපෝර්තු කරන්නේ නම් මෙම කරුණ විවාහක නි/සෙසුනිළයෙකු හට බලපෑ හැකිය.

**<u>ස්ථාන මාරු</u>**

විවාහක නි/සෙසුනිළයෙකු එක් රාජකාරි ස්ථානයක සිට තවත් රාජකාරි ස්ථානයක මාරුකල විට ඔහුගේ පවුලටත්, අයත් බඩු භාහිරාදියත් රැගෙන යාමට දුම්රිය බලපත්‍ර ලැබීමට අයිතිවාසිකම් ඇත. මෙම සහනයන් ස්ථිර ස්ථානයකට මාරුකරන ලද විවාහක පුද්ගලයින්ට සීමාවිය යුතුය. මෙහිදී ස්ථිර ස්ථානයක් වශයෙන් අදහස් වන්නේ නි/සෙසුනිළයා අඩුම වශයෙන් මාස 03කට වඩා වැඩි කාලයක් වාසය කිරීමට බලාපොරොත්තු වන ස්ථානයයි. ඊටවඩා අඩු කාලසීමාවක් සඳහා වෙනත් සේවා ස්ථානයකට වාර්ථා කරන නි/සෙසුනිළයෙකුට තම පවුල රැගෙන යාමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා වන වියදම ඔහු විසින් දැරිය යුතුය.

**<u>සේවයේ යෙදී සිටියදී මියයන නි/සෙසුනිළයෙකුගේ වැන්දඹුව</u>**

මෙහිදී රජය විසින් රජයේ සේවකයෙකුගේ වැන්දඹුව සඳහා ප්‍රමාණයන් හා කොන්දේසි අනුව සේවයේ යෙදී සිටයදී මියයන ලද නි/සෙසුනිළයෙකුගේ වැන්දඹුවකට ලංකාව තුළ පිහිටා ඇති ඇයගේ නිවසට යාම සඳහා නොමිලේ ප්‍රවාහන පහසුකම් ලබාදිය යුතුයි.

**<u>ස්වාමියා හා බිරිඳ යන දෙදෙනාම රජයේ සේවයේ නියුතු විට නිවාඩු දුම්රිය බලපත් නිකුත් කිරීම</u>**

නි/සෙසුනිළයාගේ බිරිඳ රජයේ සේවයේ නියුතුව සිටීනම්, බිරිඳ හා දරුවන් වෙනුවෙන් සෑම බලපත්‍රයක්ම නිකුත් කල යුත්තේ යුධ හමුදාව මගිනි. මේ සඳහා පහත සඳහන් විස්තර ඉදිරිපත් කල යුතුය.

අ. තම බිරිඳ රජයේ සේවයේ යෙදී සිටින බවත්, ඇය සේවය කරන දෙපාර්තමේන්තුවත්, දරණ තනතුරත්, ලබන වැටුපත්, සේවය ස්ථිරද, තාවකාලිකද යන

බවත්, අවුරුද්ද තුලදී මෙතෙක් ලබාගෙන ඇති බලපත්‍ර ගණනත්, ගමන් කිරීමට හිමිකම් ඇති පංතියත් අඩංගු ප්‍රකාශයක් ඉල්ලුම්පත සමග ඉදිරිපත් කල යුතුයි.

ආ. තමාට හෝ තම ස්වාමියාට අයිති බලපත්‍ර ලබාගන්නේ දැයි බිරිඳට තීරණය කල හැකිවේ. සෑම මුදල් වර්ෂයකම මුලදී ගනු ලබන මෙම තීරණය එම වර්ෂය තුළ වෙනස් නොවනු ඇත.

(1) එසේ වුවද ස්වාමි පුරුෂයාට ඉහත පංතියක ගමන් කිරීමට හිමිකම් ඇත්තේ නම් තම බිරිඳට පුරුෂයාට හිමිවන පංතියේම එම නිවාඩු බලපත්‍ර ගණන හිමි වන්නේය.

(2) කෙසේමුත් බිරිඳට ඉහල පංතියක ගමන් කිරීමට හිමිකම් ඇත්තේ නම් තම ස්වාමි පුරුෂයාට තම පංතියේ එම බලපත්‍ර ගණනම ලබාගන්නවාද නැතහොත් තමාට හිමි පංතියේ එක් බලපත්‍ර සඟලක් ලබාගන්නාවද ඇය තීරණය කල යුතුය.

(3) ස්වාමි පුරුෂයාට අයිති පංතියට අනුව දරුවන්ට බලපත් ලබාදිය යුතුය.

<u>**නීත්‍යානුකූලව වෙන්වූ අඹු සැමියන්:**</u>

ස්වාමිපුරුෂයා හා බිරිඳ නීත්‍යානුකූලය වෙන්ව සිටින අවස්ථාවකදී බලපත්‍ර සඳහා ඉදිරිපත් කෙරෙන ඉල්ලුම්පත් වල මේ බව සඳහන් විය යුතුයි. මෙවැනි අවස්ථාවලදී ස්වාමි පුරුෂයාට බලපත්‍ර නිකුත් කරන්නේ ඔහු අවිවාහක පුද්ගලයෙකු ලෙස සලකා ගෙනය. මේ ආකාරයට වෙන්වූ යුද හමුදා පුද්ගලයින්ගේ ළමයි වෙනුවෙන් බලපත්‍ර නිකුත් කරනු ලබන්නේ උසාවියක් මගින් මෙවැනි ළමයින් ස්වාමිපුරුෂයාගේ භාරයට ගැනීමට නියෝග කොට තිබූනොත් පමණි.

<u>**පහසුකම් දුම්රිය ගමන්:**</u>

දුම්රියේ ගමන් කිරීම සඳහා නිකුත් කරන අනුග්‍රහ වාර දුම්රිය ප්‍රවේශපත්‍ර ලබාගැනීමට යුහ අයවලුන් හට හිමිකම් ඇත. මෙම පහසුකම සෑම වසරකම සමාලෝචනයට පත්වේ.

අ. සහනදායක වාර ප්‍රවේශ පත්‍රයක් සඳහා ඉල්ලුම්පත් AF 14 දරණ ආකෘතිපත්‍රය මගින් ලංකා දුම්රිය සේවයේ ප්‍රධාන ගණකාධිකාරි වෙත ඉදිරිපත් කල යුතුයි.

ආ. ගමන් කිරීමට හිමිකම් ඇති පංතියට වඩා පහල පංතියක ගමන් කිරීමට ඔහුගේ කැමැත්ත පරිදි අනුග්‍රහ දුම්රිය බලපත්‍ර නි/සෙසුළයෙකු හට නිකුත් කල හැක.

ස්ථිර හෝ තාවකාලික සේවා ස්ථානයේ තුලවාසි වීමට නියෝග ලැබූ/අවසර දුන් සියලුම විවාහක හෝ අවිවාහක සියලු නිළ දරන්නන් මසකට එක් නිවාඩු දුම්රිය බලපත්‍රයක් හෝ දුම්රිය පහසුකම් නොමැති ප්‍රදේශයක බස් ගමන් වියදම් සඳහා වූ මුදල් ලබාගැනීමට අයිතිවාසිකමක් ලබයි.

පිටතවාසි රාජකාරි සඳහා පැමිණෙන නි/සෙසුනිළයින්ට තම පදිංචි ස්ථානය හා සේවා ස්ථානය අතර දුර ප්‍රමාණය සැතපුම් 30 ක සීමාව ඇතුලත දෛනික යෑම් ඒම් සඳහා මධ්‍යම ගමනාගමන මණ්ඩලයට අයත් බස් රථවලින් ගමන් කිරීම පිණිස නොමිලේ බස් ගමන් බලපත්‍ර ලැබීමට හිමිකම් ඇත.

ත්‍රස්ථවාදී ප්‍රහාරයකින් තුවාල ලැබ රෝහල්ගත වන නි/සෙසුනිළයෙකුගේ ලගම නෑයා වෙත රෝගියා බැලීම සඳහා තම නිවසේ සිට රෝහලට යාමට හා ඒමට දෛනික ගමන්වාරයක් සඳහා නොමිලේ බස් ගමන් බලපත්‍ර ලැබීමේ හිමිකම් ඇත.

විහනි 4/66 ට ඇමුණුම ඇ මෙම නියෝගයන් අභිබවනය කෙරේ.